616

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAM/E/TRC/01/21/10 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 අගෝස්තු 27 දින

සභාපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

CHAIRMAN'S OFFICE - T.R.C.
RECEIVED
31 AUG 2022
Time.............

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්: 1. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAM/E/TRC/01/21/10 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 අගෝස්තු 27 දින

සභාපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.1,625,000 ක් වටිනා තාක්ෂණික උපකරණ 02 ක් තාක්ෂණික උපකරණ අළුත්වැඩියා හා නඩත්තු ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ ශුද්ධ ලාභය හා දේපළ පිරියත හා උපකරණවල අගයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බද්ද වගකීම රු.40,424,129 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.1,818,166 ක උපචිත වියදම් හා රු.1,530,936 ඉදිරියට කළ ගෙවීම් ගිණුම්ගත කර නොතිබුණ අතර රු.6,010,058 ක ඉකුත් වර්ෂයේ උපචිත වියදමක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) කොමිෂන් සභාවේ දේපල පිරියත හා උපකරණවල පිරිවැය රු.13,431,433,930 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා රු.42,879,724 ක් වටිනා ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) ණයගැතියන් 72 දෙනෙකුගේ රු.361,051,927 ක් වූ ණයගැති ශේෂ තහවුරු කරගැනීමට ලිපි යවා තිබුණු අතර ණයගැතියන් දෙදෙනෙකුගෙන් පමණක් රු.742,605 ක ශේෂ තහවුරු ලිපි ලැබී තිබුණද ඉතිරි ශේෂ වෙනත් විගණන පරිපාටිවලින්ද තහවුරු කරගත නොහැකි විය.

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ආයතන 07 කින් අයවිය යුතු රු.162,004,339 ක ණයශේෂයක් පැවතියද එක් රාජ්‍ය ආයතනයක ණයහිමි ශේෂය රු.4,257,266 කින් වැඩියෙන් හා තවත් ආයතන 04 ක ණයහිමි ශේෂ නොපැවතුණු බව එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව සනාථ විය.

(ඌ) වර්ෂ කිහිපයකට වරක් පමණක් මෙහෙයුම් ක්‍රියාකරුවන්ගෙන් සංඛ්‍යාත පෙර ගාස්තු වෙනුවෙන් අයකර ගනු ලබන රු.3,324,250,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක්

ලෙස ගිණුම්ගත කර තිබුණද ආදායම හඳුනා ගැනීමේ පදනම මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්,

වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**2.1.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති

කරුණුවලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 හි (ආ), (ඇ), (ඉ) දරන නිරීක්ෂණ හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනායාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 9.12 ඡේදය | කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වෛද්‍ය රක්ෂණාවරණය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද එවැනි |

| | | |
|---|---|---|
| | | අනුමැතියක් ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.46,759,745 ක් රක්ෂණ වාරික ලෙස රක්ෂණ සමාගමකට ගෙවා තිබුණු අතර රක්ෂණ සමාගම විසින් රු.27,262,649 ක් කොමිෂන් සභා නිලධාරීන් වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| | (ii) 9.14.2 ඡේදය | බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණ අතර කොමිෂන් සභාව විසින් පමණක් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියකට අනුව කටයුතු කර තිබුණි. |
| (ආ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා, ගෙවල් කුලී දීමනා හා භාවිතයට නොගත් නිවාඩු සඳහා දීමනා ලෙස රු.141,825,830 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඇ) | 2007 ජූනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය | මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා අනුමත මාසික ප්‍රවාහන දීමනාවක් වූ රු.2,000 ඉක්මවා රු.6,000 බැගින් ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.8,620,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) නෙළුම් කුලුන ව්‍යාපෘතිය

2010 ඔක්තෝබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුලුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර 2012 ජනවාරි 03 දින කොමිෂන් සභාව මෙම සමාගම් සමඟ ඇ.ඩො. මිලියන 104.3 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව තිබුණද 2017 ඔක්තෝබර් 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා කොමිෂන් සභාව අනුමත කර තිබුණි.

මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා අරමුදල් සපයා ගැනීමට 2012 සැප්තැම්බර් 17 දින කොමිෂන් සභාව, චීන EXIM බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. එම ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් ඇ.ඩො. මිලියන 88.655 පමණක් ලබා දීමට එකඟ වී තිබුණ අතර 2016 අගෝස්තු 18 දින වන විට ණය මුදල ලබාගෙන අවසන් කළ යුතු විය. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අදාල කාලසටහනට අනුව නිම නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ණය මුදල නියමිත පරිදි ලබාගැනීමට නොහැකිවී තිබුණ අතර අදාල කාලය තුළදී ඇ.ඩො. මිලියන 67.260 ක් එනම් ණය මුදලින් සියයට 76 ක් පමණක් ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මුළු ණය මුදල සඳහා රක්ෂණ ගාස්තු, එකඟතා ගාස්තු හා කළමනාකරණ ගාස්තු ගෙවිය යුතු බැවින් ලබා නොගත් ණය මුදලට සමානුපාතිකව ඇ.ඩො. මිලියන 2.9 ක් රක්ෂණ ගාස්තු, එකඟතා ගාස්තු හා කළමනාකරණ ගාස්තු ලෙස ගෙවා තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව 2015 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමටත්, එමගින් පලමු වර්ෂ 5 සඳහා වර්ෂයකට රු.මිලියන 1,685 ක ආදායමක්ද දෙවන වර්ෂ 5 සඳහා වර්ෂයකට රු. මිලියන 1,918 ක ආදායමක්ද ඉපැයීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘති

කටයුතු ප්‍රමාදවීම මත එම වාර්ෂික ආදායම අහිමි වී තිබුණි. මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව ඉපැයීමට අපේක්ෂා කළ ආදායම මත ගණනය කළ විට 2021 දෙසැම්බර් 31 දිනට අහිමි වී තිබූ ආදායම රු.මිලියන 11,557 ක් විය.

(iii) මූලික සැලසුම් අනුව ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 9,900 ක් ණය වාරික හා පොලී වශයෙන් කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි.

(iv) 2019 සැප්තැම්බර් 16 දින රු.මිලියන 11.3 ක වියදමක් දරා නෙළුම් කුලුන නිල වශයෙන් විවෘත කළද 2022 අගෝස්තු මාසය වන විටත් ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි.

(v) කොමිෂන් සභා තීරණ අනුව නෙළුම් කුලුන වාණිජ්‍යකරණය කිරීමේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ දරන ලද රක්ෂණ වාරික හා කොන්ත්‍රාත් කාර්යමණ්ඩල දීමනා ලෙස එකතුව රු.මිලියන 56 ක් නෙළුම් කුලුන වාණිජ්‍යකරණය සම්බන්ධයෙන් ස්ථාපිත කරන ලද Colombo Lotus Tower Management Company (Pvt) Ltd සමාගමෙන් අයකර ගැනීමේ පදනම මත ලැබිය යුතු ගිණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) නෙළුම් කුලුන ව්‍යාපෘතිය සඳහා උපදේශන ගාස්තු ගෙවීම

අංක 10/2473/401/031 හා 2010 ඔක්තෝබර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය, පරිදි නෙළුම් කුලුන ඉදිකිරීම වෙනුවෙන් උපදේශන සේවා ලබාගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමග ගිවිසුම්ගත වීමට අනුමැතිය හිමිවී තිබුණි. ඒ අනුව 2013 පෙබරවාරි 15 දින උපදේශන සේවා ලබාගැනීම සඳහා දෙපාර්ශවය අතර අත්සන් කරන ලද ගිවිසුම් උපදේශන ගාස්තු ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 1.5 ක් එනම් රු. මිලියන 198.7 ක් ගෙවීමට එකඟ වී තිබුණි. එම මුදලින් රු. මිලියන 150 ක් පමණක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබූ අතර අංක 2k15.219.13(ii) හා 2015 නොවැම්බර් 26 දිනැති කොමිෂන් සභා තීරණය මත උපදේශන සේවා ගිවිසුම 2017 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව මාසිකව රු.මිලියන 03 බැගින් රු.මිලියන 72 ක් මොරටුව විශ්වවිද්‍යාලය වෙත ගෙවීම් කර තිබුණි. එකී ගිවිසුම දීර්ඝ කළ කාලය අවසාන වීමෙන් පසු ද 2017 නොවැම්බර් 01 දින සිට 2019 සැප්තැම්බර් 16 දින දක්වා වූ කාලය සඳහා රු.මිලියන 59.8 ක් උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි.

2019 සැප්තැම්බර් 16 දින නෙළුම් කුලුන විවෘත කිරීමෙන් පසු නෙළුම් කුලුන කොමිෂන් සභාව වෙත පවරා නොදීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 51.1 ක් උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණු සමස්ත උපදේශන ගාස්තු ප්‍රමාණය රු.මිලියන 332.9 ක් වූයෙන් ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා රු. මිලියන 134.2 ක් ගෙවා තිබුණි.

(ඇ) හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ 2014 ජූලි 28 දින එළඹුණු ගිවිසුම කොමිෂන් සභාව විසින් 2016 අගෝස්තු 10 වන දින අවසන් කර තිබූ අතර එම තීරණයට එරෙහිව ඇස්තමේන්තුගත වන්දිය රු.736,276,907 ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් බේරුම්කාර මණ්ඩලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත්කර තිබුණි. කොන්ත්‍රාත්තුව නිම කරන දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 33 ක් වූ අතර ඒ සඳහා දරන ලද රු.මිලියන 684 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඈ) කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැට් රහිත වටිනාකම රු.139,882,281 කට පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුවක් 2019 ජනවාරි 31 දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුම් කරන ලද ප්‍රමාන බිල්පත්‍රයෙහි ඇතුළත්ව නොමැති රු.59,374,600 ක් වටිනා විචලතාවයන්ට ගෙවීමට කොමිෂන් සභාවේ අනුමැතිය නොලැබීම නිසා 2020 ජූලි 21 දින සිට ඉදිකිරීම් නතර කර තිබුණි. පසුව 2021 දෙසැම්බර් 14 දිනැති අමප/21/306/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මත කොමිසම විසින් රු.24,360,085 ක් වූ ප්‍රමාණ බිල්පත්‍රයෙහි ඇතුළත් නොවූ විචලතාවයන් සඳහා 2022 පෙබරවාරි 28 දින කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණද 2019 පෙබරවාරි 13 දින සිට දින 270 ක් තුළ නිම කළ යුතු මෙම ව්‍යාපෘතිය 2022 ජූනි 02 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඉ) ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 200 ක් වූ කොමිෂන් සභාවේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ඊට අදාළව මොරටුව විශ්වවිද්‍යාලය සමඟ 2019 ජූනි 10 දින එළඹි ගිවිසුම මත 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් වෙනුවෙන් උපදේශන සේවා ගාස්තු ලෙස රු.7,318,256 ක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. ගිවිසුම අනුව 2020 පෙබරවාරි 15 දින වන විට කොන්ත්‍රාත්තුව නිමකර කොමිෂන් සභාවට භාරදීමට කටයුතු කර නොතිබූ අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොතිබුණි.

## 2.3 වෙනත් නිරීක්ෂණ

(අ) හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි පර්චස් 6.21 ක ඉඩමෙහි අයිතිය පවරා ගැනීම සඳහා 1999 හා 2010 වර්ෂවලදී එහි තක්සේරු වටිනාකම හා වෙනත් වියදම් සඳහා රු.345,502 ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එහි අයිතිය සමාලෝචිත වර්ෂයේදී ද ලබාගෙන නොතිබුණි. තවද ප්‍රධාන කාර්යාලය හා කොකාවිල් බහුකාර්යය මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල හිමිකම් ඔප්පු හෝ බදු ගිවිසුම් හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ලබාගෙන නොතිබුණි.

(ආ) කොකාවිල් කුලුන භාවිතා කරන ක්‍රියාකරුවන්ගෙන් විදුලි බිල්පත් ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු මුදල රු.93,612,539 ක් වූ අතර රාජ්‍ය ආයතන 03 කින් අයවිය යුතු රු.92,656,990 ක ශේෂයක් එයට ඇතුළත් වී තිබුණි.

(ඇ) ණයගැති ශේෂය තුළ පවතින බලපත්‍ර හිමියන්ගෙන් වැඩිපුර අයකර ගන්නා ලද ශේෂවල එකතුව රු.2,178,047 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඈ) දුරකථන ක්‍රියාකරුවන් සතුව පවතින දත්ත සමඟ කොමිෂන් සභාව සතු ASMS (Antenna Structure Management System) දත්ත සමඟ කරන ලද සැසඳීම් අනුව කොමිෂන් සභාවේ අනුමැතිය නොලත් කුලුනු 941 ක් ද කොමිෂන් සභාව තවදුරටත් හඳුනා නොගත් කුලුනු 2,778 ක් ද පැවතුණි.

(ඉ) මහජන බැංකුවේ අංක 119-1-001-4-3693169 දරන ජංගම ගිණුමට බැරකරන ලද නමුත් 2022 පෙබරවාරි 28 දිනට හඳුනා නොගත් රු.31,586,543 ක ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඊ) පුද්ගලික ආයතනයකින් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාලව ලැබිය යුතු රු.6,358,657 ක විදුලි සංදේශ බදු ආදායම හා පසුගිය වර්ෂ 03 ක් සඳහා ආයතන 02 කට අදාලව විදුලි සංදේශ බදු සම්බන්ධයෙන් ලැබිය යුතු රු.5,083,244 ක අධිභාර මුදල් 2022 ජූනි 06 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(උ) කොමිෂන් සභාව විසින් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිල්ලක් 2015 වර්ෂයේදී භාරදී තිබුණද ඒ සඳහා ගෙවූ අත රැඳවුම් මුදල වූ රු.1,350,000 ක් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඡ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාලව ගෙවා තිබූ සෙස් ගාස්තුවලට අදාළ එකතුකළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල වන රු.3,411,488 ක් හා 2011 හා 2012 වර්ෂයන්ට අදාළව අයවිය යුතු සෙස් ගාස්තු වන රු.254,135 ක් පුද්ගලික ආයතන දෙකකින් අයකරගත යුතුව තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය අවසානයට කොමිෂන් සභාවේ පුරප්පාඩු 79 ක් වූ අතර අතිරේක/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ හා නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු 31 ක් එහි ඇතුළත්ව තිබුණි. එසේම නිත්‍ය කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර ද්විතීයන හා කොන්ත්‍රාත් පදනම මත පිළිවෙලින් නිලධාරීන් 07 දෙනෙකු හා 11 දෙනෙකු 2021 දෙසැම්බර් 31 දින වන විට බඳවාගෙන තිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන වැටුප්, නිවාස කුලී දීමනා, දිරි දීමනා හා ප්‍රවාහන දීමනා ලෙස රු.1,815,699 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති